# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1823/10 – 2013 අගෝස්තු 13 වැනි අඟහරුවාදා – 2013.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 256 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2012/ඩබ්එස්/242.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: MTR/LND/ACQUI/LI/3929.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, මාතර.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කඩවත් සතර සුළු කොට්ඨාසයේ, වෙලේගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/MTR/2012/450 හා 2013.02.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ සහ බී ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0966ක් පමණ වන පහත සඳහන් ඉඩම් කැබලි දෙක (2)ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කුරක්කන්කනත්තේ පිටවගුර ඉඩම, වරි. අංකය සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0190**
උතුරට: ඇළ; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: කේ. ඒ. ලාල් සහ තවත් අය හිමිකම් කියන ඩිංගි පදිංචිව සිටි වත්ත හෙවත් කුරක්කන්කනත්තේ පිටවගුර ඉඩම; බටහිරට: එච්. ජී. නිමල් සහ තවත් අය හිමිකම් කියන ඩිංගි පදිංචිව සිටි වත්ත හෙවත් කුරක්කන් කනත්තේ පිටවගුර ඉඩම සහ ඇළ.

02. **කැබලි අක්ෂර 'බී' – කුරක්කන්කනත්තේ පිටවගුර ඉඩම, වරි. අංක 5/21, 6/21 වෙලේගොඩ නැගෙනහිර – ප්‍රමාණය: හෙක්. 0.0776**
උතුරට: ඇළ; නැගෙනහිරට: මාතර ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් තුපවෙල; දකුණට: කේ. ඒ. ලාල් සහ තවත් අය හිමිකම් කියන ඩිංගි පදිංචිව සිටි වත්ත හෙවත් කුරක්කන්කනත්තේ පිටවගුර ඉඩම; බටහිරට: කැබලි අක්ෂර ඒ සහ ඇළ.

08 - 865


1A – G18079 – 320 (2013/08)


*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 258 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/4/2012/J/298.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: PTB/LND/ACQVI/7/29.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරුවිධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, පිටබැද්දර.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළය සුළු කොට්ඨාසයේ, කදුරුවාන (අ.ග.පි. 9) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් ගේ අංක MR/PTB/2012/618 හා 2013.02.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ', 'බී' සහ 'සී' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 8.6455ක් පමණ වන හුලංදොව වත්ත බුළුවන කොටස නමැති ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හුලංදොව වත්ත බුළුවන කොටස – ප්‍රමාණය: හෙක්. 0.7586**

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස සහ කැබලි අක්ෂර බී; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස, කැබලි අක්ෂර බී සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස.

02. **කැබලි අක්ෂර 'බී' – හුලංදොව වත්ත බුළුවන කොටස – ප්‍රමාණය: හෙක්. 4.9082**

උතුරට: කැබලි අක්ෂර ඒ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස සහ කැබලි අක්ෂර සී; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස, කැබලි අක්ෂර සී, මාර්ගය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස; දකුණට: මාර්ගය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස, මාර්ගය, ශ්‍රී මුතුමාලි අම්මාන් කෝවිල හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස සහ මාර්ගය; බටහිරට: මාර්ගය, ශ්‍රී මුතුමාලි අම්මමාන් කෝවිල හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස සහ මාර්ගය.

03. **කැබලි අක්ෂර 'සී' – හුලංදොව වත්ත බුළුවන කොටස – ප්‍රමාණය: හෙක්. 2.9787**

උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස සහ මාර්ගය; දකුණට සහ බටහිරට: මාර්ගය, කැබලි අක්ෂර බී සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන හුලංදොව වත්ත බුළුවන කොටස.

08 - 866

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 58 දරන ආඥාව**

මගේ අංකය: 4/3/15/2011/වීඊ/144.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 140/4/15/12/37.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානයට යටත්ව අංක 1798/20 හා 2013.02.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 2A පිටුවේ 2013 අංක 58 දරන ආඥාව යටතේ පළ කරන ලද ඉඩමේ විස්තරයට අදාළ ඉඩම පිහිටි ගමේ නම "මලන්දෙනිය (අ.ග.පි. 688)" යන්න "ලිණියාගල (අ.ග.පි. 688)" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 11 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 867

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.